# ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වය හා එහි ප්‍රවනතා

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***පබසරා රණසිංහ***[1]

**සංක්ෂේපය**

රටක් සංවර්ධිත මට්ටම කරා ලඟා වීමේ දී ආර්ථික, දේශපාලන, සාමාජීය යනාදී සෑම ක්ෂේත්‍රයකම ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ලඟා කරගෙන තිබිය යුතු වේ. ඒ අතරින් ආර්ථික වර්ධනයට වැඩි වැදගත්කමක් හිමි වේ. ඊනෑ ම රටක ආර්ථික වර්ධනය කෙරෙහි එරට සතු ශ්‍රමබලකායේ ප්‍රමාණාත්මකභාවය මෙන් ම ගුණාත්මකභාවය ද වැදගත් වේ. ඓතිහාසිකව පුරුෂ ශ්‍රමබලකා සහභාගීත්වය සෑම රටකම කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වය වැඩි අගයක් හිමිකර ගෙන ඇත. එසේ වුව ද ප්‍රත්‍යක්ෂ මූළ සාධක අනුව තහවුරු වන පරිදි රටක් සංවර්ධනය වන විට කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වය ක්‍රමයෙන් වර්ධන වේ. ආර්ථික හා සමාජීය සාධක රාශියක් මේ කෙරේ බලපාන බව හඳුනාගෙන ඇත.

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වය සම්බන්ධ තත්ත්වය තරමක් ගැටලු සහගත ස්වරූපයක් පෙන්වයි. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් කාන්තාවන්ගේ ප්‍රතිශතය 50 ඉක්මවන වන නමුත් ශ්‍රමබලකාය තුළ ඔවුන්ගේ සහභාගීත්වය පුරුෂ ශ්‍රමබලකා සහභාගීත්වයෙන් හරි අඩක් පමණක් වේ. තව ද කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වයේ වර්ධනය ද ඉතා මන්දගාමී ය. දකුණු ආසියානු කලාපය තුළ මෙන් ම සාපේක්ෂ වශයෙන් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ශ්‍රී ලංකාව ඉහළ සමාජ සංවර්ධන මට්ටමක් අත්කරගෙන ද එම රටවලට සාපේක්ෂව ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ශ්‍රමබලකා සහභාගිත්වය අවම මට්ටමක පැවතීම අවධානයට යොමු විය යුතු ගැටලුවකි.

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වයේ පවත්නා තත්ත්වය, එහි ප්‍රවනතා සහ කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වය තීරණය වන සාධක පිළිබඳ විමර්ශනය කිරීමයි. එයට අමතරව කාන්තා ශ්‍රමබලකා සහභාගීත්ය සම්බන්ධ U කල්පිතය ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වයට කෙසේ අදාළ වේ ද යන්න පරීක්ෂා කිරීම බලාපොරොත්තු වේ.

මානව සම්පත එලදායී ලෙස කළමනාකරණය කරමින් රට තුළ සිටින තරුණ ශ්‍රම බලකාය වඩාත් කාර්යක්ෂම ලෙස මෙහෙයවමින් රටෙහි සංවර්ධිත අරමුණු ලඟාකර ගැනීම සඳහා වූ ප්‍රතිපත්ති සම්පාදනයේදී මේ මගින් හෙළිවන තොරතුරු වැදගත් වේ.

ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්ත ද මෙහිදී විශ්ලේෂණය කෙරේ. එහිදී විස්තරාත්මක සංඛ්‍යානමය ශිල්ප ක්‍රම මෙන්ම විචල්‍ය අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීම සඳහා ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමය ද යොදා ගැනේ. මූලික විශ්ලේෂණයේ දී හෙළිවන පරිදි ඒක පුද්ගල ආදායම හා කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වය අතර ප්‍රතිලෝම සම්බන්ධතවක් පවතී කෙසේ වුව ද එය ආන්තික සම්බන්ධතාවකි. කාන්තා ශ්‍රමබලකා සහභාගීත්ය සම්බන්ධ U කල්පිතය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තහවුරු නොවේ. දත්ත ප්‍රමාණවත් නොවීම මෙයට හේතු විය හැකි ය.

**ප්‍රමුඛ පද- ශ්‍රම බලකාය, ආර්ථික වර්ධනය, කාන්තා ශ්‍රමබලකා සහභාගීත්වය, U කල්පිතය**

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය ; Pabasara91@gmail.com

[2] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය ;